දිඹුලාගල ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 18 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කළ යුතුවේ. | අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමට බලාපොරොත්තු වෙමි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි උපකරණ, ජලනල උපකරණ හා උප පත්‍රිකා පොත් වටිනාකම රු.131,592 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම තුළ ජ'නල් අංක 02,03,04 මගින් නිවැරදි කර ගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාල තොරතුරු ඉඩම් |

| | | | |
|---|---|---|---|
| | | | රෙජිස්ට්‍රාර් ආයතනයෙන් මේ වන තෙක් පිළියෙල කර නොමැති බව වාචිකව දැන්වීම හේතුවෙන් ආදායම හඳුනා ගැනීමට නොහැකි විය. |
| (iii) | පොළොන්නරුව උසාවියෙන් ලැබිය යුතු සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ දෙසැම්බර් මාසවල උසාවි දඩ බිල් කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 දෙසැම්බර් මස වාර්තා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ලබාදී නොමැති බව දුරකථන ඇමතුම් මඟින් විමසීම් කිරීමේදී දැනුම් දුනි. |
| (iv) | සමාලෝචිත වර්ෂය තුල තැන්පත් කල රු.60,001 ක සේවක ඇප තැන්පත් ශේෂයක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම තුළ නිවැරදි කරමි. |

**(ඇ) නොසැසඳුනු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව කර්මාන්ත ණයහිමි ශේෂය රු.43,514,522 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එය රු.61,372,154 ක් වූයෙන් රු.17,857,632 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුම තුළ එය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව කර්මාන්ත ණයගැති ශේෂය රු.50,206,035 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එය රු.44,088,355 ක් වූයෙන් රු.6,117,680 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ ගිණුම තුළ එය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනය අනුව හිඟ ජල ගාස්තු ශේෂය රු.9,802,828 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එය රු.8,982,653 ක් වූයෙන් රු.820,175 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | පරීක්ෂා කර වඩාත් නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනය අනුව ආදායම් ණයගැති ශේෂය රු.651,015 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එය රු.1,311,015 ක් වූයෙන් රු.660,000ක නොසැසඳීමක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේ පළාත් පාලන ආයතනයේ ලැබිය යුතු සහික දීමනා ශේෂයකි. |

## 1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක පරිසර බලපත්‍ර නිකුත් කල යුතු කර්මාන්ත හඳුනාගෙන පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බල ප්‍රදේශය තුල පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන හඳුනාගෙන බලපත්‍ර ලබාදිය යුතුවේ. | 2020 වර්ෂයට අදාල එම කටයුතු නිසි නිලධාරියෙකු පත්කර නිසි ක්‍රමවේදයකට බලපත්‍ර නිකුත් කිරීම සිදුකරන බව දන්වමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | රීති අංක 59 - 63 | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලැයිස්තු පිළියෙල කර ඒ අනුව ගාස්තු අයකළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**1.5 ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වර්ෂ 01 සිට වර්ෂ 09 ක කාලයක සිට පැවත එන කඩ කාමර 13 ක රු.266,660 ක් වූ හිඟ කඩකාමර කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කඩ කාමර 08 ක ගිවිසුම් හෝ ලේඛන නොතිබීම හේතුවෙන් ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වී ඇත. කඩ කාමර 02 ක් සඳහා 2019 දෙසැම්බර් 24 දින මහා සභාවේ තීරණය පරිදි කටයුතු කිරීමට පියවර ගෙන ඇත, කඩ කාමර 03 ක් වසා ඇත. අදාල පුද්ගලයින් සොයාගත නොහැක. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබෙන 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයට අදාල එකතුව රු.953,250 ක සතිපොළ බදු ආදායම අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.15,000 ක මුදලක් අයකරගෙන ඇත. මේ පිළිබඳව වැඩිදුර සොයා බැලීම සඳහා ආදායම් පරීක්ෂක නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇත. ඔවුන්ගේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.903,111 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,869,164 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 32,264,984 | 38,153,624 | 38,880,216 | 8,982,653 | 23,561,440 | 23,252,875 | 21,989,794 | 9,709,245 |
| (ii) | කුලී | 8,017,655 | 4,659,317 | 3,083,698 | 2,538,565 | 7,874,700 | 3,989,520 | 3,360,008 | 1,384,067 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 528,000 | 344,930 | 470,030 | 2,059,679 | 528,000 | 534,670 | 439,670 | 2,160,779 |
| (iv) | වෙනත් ආදායම් | 22,379,250 | 15,319,106 | 23,019,449 | 16,685,082 | 14,988,550 | 16,806,291 | 6,161,362 | 24,305,423 |
| | එකතුව | 63,189,889 | 58,476,977 | 65,453,393 | 30,265,979 | 46,952,690 | 44,583,356 | 31,950,834 | 37,559,514 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරන ජල ව්‍යාපෘති 04 හි හිඟ ජල ගාස්තු ආදායම රු. 8,982,653 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | හිඟ ජල ගාස්තු ආදායම අය කරගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ආදායම රු.2,538,565 ක් වූ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 83 කින් ඉහල ගොස් තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ පොල බදු හා කඩ කුලී ශේෂය පෙර වර්ෂයට සාපේක්ෂව ඉහල ගොස් ඇත. මෙම හිඟ ශේෂය අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ මුදල රු. 15,211,215 ක් විය. 2018 දෙසැම්බර් 31 දිනට | හිඟ මුදල් ලබා ගැනීමට හා හඳුනානොගත් ආදායම් හඳුනාගැනීමට කටයුතු කළ | 2020 මැයි 26 දින වන විටත් වාර්තා සකස් කර නොමැති බවත් |

| | | |
|---|---|---|
| හිඟ මුද්දර ගාස්තු ආදායම රු. 835,502 ක් වූ අතර, 2019 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන නොතිබුණි. | යුතුවේ. | කඩිනමින් අදාල තොරතුරු ලබාදීමට කටයුතු කරන බවත් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් දුරකථනයෙන් දැනුම් දෙන ලදී. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් කෙරෙහි සභාවේ ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනකට යොමු කිරීමට කටයුතු කළ යුතුවේ. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හා වෙනත් වගකිව යුතු ආයතන වෙත දැනුම් දී ඇතත් මෙතෙක් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැත. සුදුසු භූමියක් ලද විගස මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ක්‍රියාකරන බව ප්‍රකාශ කරමි. |

### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වාදී තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා එම අරමුණු මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන තිබුණද, ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය කටයුතු 2020 වර්ෂයේ සිට සිදුකරන බව කාරුණිකව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ වැඩ ආරම්භ කර මේ වන විට ඉදිකිරීම් නවතා ඇති අරලගංවිල සතිපොළ භූමියේ කඩකාමර සම්බන්ධයෙන් ඵලදායි තීරණයක් ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ඵලදායී ලෙස උපයෝජනය කිරීමට හැකිවෙන ලෙස කටයුතු කළ යුතුවේ. | සභා අරමුදල් යොදවා අදියරෙන් අදියර මෙම කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. |
| (ආ) | සභාවේ කටයුතුවලට අදාලව පවත්නා නඩු කටයුතු සම්බන්ධව තොරතුරු සභාව සතුව නොතිබුණි. | නඩු සම්බන්ධව ලේඛනයක් හා නඩුගොනු පවත්වාගත යුතුවේ. | නඩු ලේඛනයක් හා නඩුගොනු පවත්වා ගනිමින් අදාල නඩු විභාග වන දින වලදී සභාවේ නිලධාරියෙකු හා නීතිඥවරයෙකු යෙදවීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | කර්මාන්ත ණයගැති හා ණයහිමි ශේෂ පැහැදිලිව හඳුනාගත හැකි පරිදි කර්මාන්ත ලේඛනය, කර්මාන්ත ණයගැති හා ණයහිමි ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර, කර්මාන්ත තැන්පත් ශේෂ තැන්පත් කරන අවස්ථාවේ ලේඛනගත නොකර නිරවුල් කරන අවස්ථාවේ ලේඛනගත කර තිබුණි. | කර්මාන්ත ණයගැති, ණයහිමි හා කර්මාන්ත ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර කර්මාන්ත තැන්පත්, තැන්පත් කරන අවස්ථාවේ ලේඛනගත කළ යුතුවේ. | ලේඛන නිවැරදි කොට යාවත්කාලීනව පවත්වාගෙන යාමට 2020 වර්ෂයේ සිට අදාල විෂය ලිපිකාරීන් වෙත දැනුම් දී ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| | | | |
|---|---|---|---|
| (i) | සභාවේ ලේකම් තනතුර සඳහා වැඩ බැලීමේ පත්වීමක් ලබාදී තිබුණි. ද්විතීය මට්ටමේ තනතුරු 06 කට කොන්ත්‍රාත් හා අනියම් පදනම මත බඳවාගෙන තිබුණි. ප්‍රාථමික කාර්යමණ්ඩලය තුල සේවකයින් 26 කගේ අතිරික්තයක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වත්මන් වැඩ බලන ලේකම් තුමිය වෙත විධිමත් පත්වීම් ලිපියක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. පවත්නා කාර්යයමණ්ඩල හිඟය මඟ හරවා ගැනීම සඳහා අනියම් පදනම මත බඳවාගෙන ඇත. සභාව |

| | | | |
|---|---|---|---|
| | | | සතු කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන් 2019 ජූලි මස 11 වන දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ වී ඇති අතර ඒ අනුව මු.රෙ.71 යටතේ කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | අනාර්ථික වියදම්<br>------------------- | | |
| | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවය සඳහා අනුයුක්ත කර තිබූ සේවක මහතෙකුට දිඹුලාගල ප්‍රාදේශීය සභාව විසින් කිසිදු සේවයක් ලබා නොගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.946,728 ක් ගෙවා තිබුණි. | සභාව මගින් වැටුප් ගෙවීම අත්හිටුවීම කළ යුතුවේ. | මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට අනුයුක්ත කර ඇත්තේ උතුරු මැද ප්‍රධාන අමාත්‍යංශ ලේකම්ගේ NCP/CM/ED/03/01/ප්‍රාස/පොදු හා 2019 ජූලි 29 දිනැති ලිපියේ නියෝගය අනුවය. |
| (ඇ) | සේවක ණය<br>------------- | | |
| | නිලධාරීන් වෙත ලබාදී ඇති රු.159,755 ක් වටිනා සේවක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණය සම්බන්ධව ඇපකරුවන් හා අදාල තොරතුරු නොමැතිකමින් සේවය හැරගිය හා වැඩ තහනම් වූ නිලධාරීන්ගේ ණය අයකර ගැනීමට නොහැකි බව දන්වා සිටිමි. මිය ගිය නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිතයෙන් මෙම ණය අයකිරීමට කටයුතු කරමි. |
| **3.4** | **මෙහෙයුම් අකාර්යක්ෂමතා**<br>------------------------------- | | |
| (අ) | රක්ෂිත භූමියක පවත්වාගෙන යන කළුකැලේ සතිපොල අයිතිය සභාව සතුව නොමැතිවීම හේතුවෙන් සංවර්ධනය කර ආදායම් උත්පාදන කාර්යයට දායක කර ගැනීමට නොහැකි වී තිබුණි. | අයිතිය තහවුරු කරගැනීමට හා සංවර්ධනය කර ආදායම් උත්පාදන කාර්යයට දායක කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ඉල්ලීමක් කර සුදුසු භූමි භාගයක් වෙන්කරවා ගන්නා තෙක් ආදායම් පරිපාලන |

| | | | |
|---|---|---|---|
| | | | නිලධාරීන් මඟින් ආදායම් එකතු කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 වර්ෂයේදී ආදායම් පරිපාලක විසින් සිදුකල තාවකාලික තක්සේරුවක් මත කඩ කුලී අයකර තිබුණි. | විධිමත් තක්සේරුවක් සිදුකර ගාස්තු අයකළ යුතුවේ. | අයිතිය පවරාගැනීමෙන් පසු විධිමත් ලෙස තක්සේරු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | දුරකථන සන්නිවේදන කුළුණු සඳහා අයවිය යුතු රු.33,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු සලසා ගන්නා බව දන්වමි. |
| (ඇ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි දියුණු ප්‍රදේශ හඳුනාගෙන ඇතත් වරිපනම් අයකර ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | වරිපනම් අයකරගැනීමට අදාල ඉදිරි කටයුතු සිදුකළ යුතුවේ. | සිතියම් අනුමත කර ගැනීම සම්බන්ධව තොරතුරු මහා සභාවට ඉදිරිපත් කර පළාත් පාලන කොමසාරිස්තුමිය වෙත යොමු කරවීමට අවශ්‍ය කටයුතු සලසා ගන්නා බව කාරුණිකව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| | | |
|---|---|---|
| සභාව සතු වූ අරලගංවිල සතිපොළ භූමියේ ඇති මිරිදිය මාළු කඩ කාමරයෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු ගාස්තු හා කුලී රු.1,493,068 ක් අයකර ගැනීමට හා ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩකාමරයේ අයිතිය ආරක්ෂා කර ගැනීමට හා හිඟ කුලී මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධව විමර්ශන නිලධාරීන් විසින් ලබාදී ඇති වාර්තාව අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත. |

**3.6 දෘශ්‍ය අක්‍රමිකතා**

| | | | |
|---|---|---|---|
| (අ) | ආදායම් පරීක්ෂකවරයෙකු විසින් ක්ෂේත්‍රයේ වෙළඳ බලපත්‍ර ගාස්තු එකතු කරන ලදුපත් 100 කට අදාල ලදුපොත් 02 ක් නැවත භාරදී නොතිබීම නිසා සභාවේ ලේඛනවල හිඟයන් ලෙස පෙන්වන අතර, මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් 2019 දෙසැම්බර් 31 වන විටත් සිදුකර නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මූලික විමර්ශනයක් සිදුකොට චෝදනා පත්‍රයක් යොමු කොට උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 ජූනි සිට 2017 ජූනි 28 දක්වා කාලය තුල ජල ගාස්තු අයකිරීමේදී ලැබීම් කුවිතාන්සිවල මුල් පිටපතේ සඳහන් මුදලට වඩා අඩු මුදලක් අනුපිටපතෙහි සඳහන් කර රු.2,625,660 ක් බැහැර කරගැනීම පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර පාඩුව අයකර ගත යුතුවේ. | මූලික විමර්ශනයක් උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙමින් පවතී. විමර්ශන කටයුතු කඩිනම් කරදෙන මෙන් ඉල්ලා 2020.05.21 දින මා විසින් ලිපියක් මගින් ඉල්ලා ඇත. |
| (ඇ) | ජල ව්‍යාපෘති කාර්යාල විසින් ජල පාරිභෝගිකයින්ගෙන් මුදල් අයකිරීමට යොදාගන්නා ලද අංක 53951-54000 දක්වා වූ ලැබීම් කුවිතාන්සි පොත අස්ථානගතවීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | අස්ථානගත වූ පොත් හා ඊට අදාල මුදල් අයකරගත යුතුවේ. | මීට සම්බන්ධ නිලධාරියා දැනට ස්ථාන මාරු වී ඇති බැවින් මේ පිළිබඳව සොයා බලා මසක් ඇතුලත වාර්තාවක් ලබාදීමට කටයුතු කරමි. |

**4 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් විධිමත්ව සිදුකළ යුතුවේ. | මින් ඉදිරියට අභ්‍යන්තර විගණන වාර්තා දී ඇති උපදෙස් පරිදි වගකිව යුතු අංශ වෙත ඉදිරිපත් කිරීමට හා ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

**4.2 නොවිසඳී ඇති විගණන ඡේද**

| | | | |
|---|---|---|---|
| (අ) | 2014 දෙසැම්බර් 16 දින සභාවට ලැබී තිබූ ගැලවනයිස් කොඩිකණු 360 ක් හිටපු සභාපතිවරයා හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු වෙත නිකුත් කර වසර 05 කට අධික කාලයක් ගතව ඇතත් ඒවා ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණි. | එම භාණ්ඩ ආපසු ලබාගැනීමට පියවර ගත යුතුවේ. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මූලික විමර්ශනයක් මගින් කරුණු තහවුරු කරගැනීමෙන් පසු කටයුතු කිරීමට අදාල උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලා උතුරු මැද පළාත් පාලන කොමසාරිස්තුමිය වෙත දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 පෙබරවාරි 20 දින මිළටගෙන තිබූ සභාවේ වත්කම් වශයෙන් ඉන්වෙන්ට්‍රිගත ඩෙල් වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් හා iPad 01 ක් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු වෙත නිකුත් කර වසර 4 ½ කට අධික කාලයක් ගතවී ඇතත් ඒවා ආපසු සභාව වෙත ලබාගෙන නොතිබුණි. | අදාල පුද්ගලයන්ගෙන් උපකරණ හෝ එහි වටිනාකම ලබාගත යුතුවේ. | අදාල නිලධාරීන් නැවත දැනුවත් කර ඇත. |